රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2024

මගේ අංකය : EST-01/MISCL/06/0032(II)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.12.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## "ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka)" ජාතික වැඩසටහන සමඟ 2025 වසරේ රාජකාරී කටයුතු ඇරඹීම

ආදර්ශය ලබා දීම, පෙලඹවීම, යොමු කිරීම සහ වෙනස් වීමේ අවශ්‍යතාව ශක්තිමත්ව තහවුරු කිරීම තුළින් සමාජයක චර්යාමය වෙනස්කම් සිදු කිරීමේ ශක්තිමත් ප්‍රවේශයක් ලබා ගත හැකි ය. එමඟින් රටක්, ආර්ථික, සමාජමය, සංස්කෘතික, සදාචාරමය හා පාරිසරිකව ප්‍රගමනයක් කරා රැගෙන යාමේ සංවිධිත වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු ය. ඒ සඳහා, රටක පාලනය හොබවන කණ්ඩායමත්, රාජ්‍ය සේවකයාත්, පුරවැසියාත් එක්ව, සාමූහිකව, එක් අරමුණක් හා දිශානතියක් ඉලක්ක කර ගනිමින් කටයුතු කළ යුතු ය. ජාතික මට්ටමින් එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව නව රජය විසින් හඳුනාගෙන ඇත.

02. රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේදී රටේ සමස්ත පුරවැසියන් ජාති, ආගම්, කුල, ප්‍රදේශ හා දේශපාලන භේද පසෙක ලා එක් ජාතියක් ලෙස නැගී සිටිය යුතු ය. දීර්ඝ කාලයක් ජනතාවගේ ප්‍රාර්ථනයක් බවට පත් වුණු ජාතික සමඟිය ගොඩනැඟීම සඳහා වන ඉතා ප්‍රබල ඉඩ ප්‍රස්තාවක් මේ වන විට රට තුළ නිර්මාණය වී ඇත. මෙම තත්ත්වය තහවුරු කරගත යුතු අතර නැවතත් ආගමික අන්තවාද හෝ ජාතිවාද වෙත නොයන පරිදි සවිමත් සමාජ ව්‍යුහයක් නිර්මාණය කර ගැනීමේ වගකීම රටක් ලෙසට අප වෙත පැවරී ඇත.

03. රාජ්‍ය සේවකයින් වන අප විසින් අවධානයට ගත යුතු කරුණක් වන්නේ පොදු ජනතාව තුළ රාජ්‍ය සේවය කෙරෙහි කිසියම් අයහපත් ආකල්ප රැසක් නිර්මාණය වී ඇති බවයි. මෙරට රාජ්‍ය සේවයෙන් රටේ ජනතාවගේ අපේක්ෂා ඉටු නොවන්නේ නම් හෝ තෘප්තිමත් නොවන්නේ නම් හෝ ඒ ගැන ගැඹුරින් සිතා බලා රාජ්‍ය සේවය නැවත ප්‍රතිසංස්කරණය කළ යුතුව පවතී. මේ සඳහා නව රජය විසින් යෝජනා රැසක් ඉදිරිපත් කර ඇති අතර එම යෝජනා ක්‍රියාත්මක කර, රාජ්‍ය සේවය කෙරෙහි වන මහජන විශ්වාසය නැවතත් දිනා ගැනීමේ වගකීම ද රාජ්‍ය සේවයට ම පැවරී ඇත. සෑම රටකම සංවර්ධනය කෙරෙහි ශක්තිමත් රාජ්‍ය සේවයක් ඉවහල් වන අතර සංවර්ධන අරමුණු සාර්ථකව ළඟා කරගත් සෑම රටක් ම පාහේ ඒ සඳහා රාජ්‍ය සේවයෙන් විපුල පිටුබලයක් ලබා ගෙන ඇත. මෙරට රාජ්‍ය සේවය මෙම පූර්වාදර්ශ ඔස්සේ යමින් නවමු ප්‍රවේශයකින් කටයුතු කළ යුතු අභියෝගාත්මක කාල පරිච්ඡේදයකට මුහුණ දී සිටියි.

04. සමස්ත රාජ්‍ය සේවය ම පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් වෙනුවෙන් ප්‍රතිදිශාගත කිරීමට සියලු රාජ්‍ය සේවකයන් අධිෂ්ඨාන කරගත යුතු ය. ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ක්‍රියාත්මක කිරීමේදීත්, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදීත් සහ මහජන සේවා ලබා දීමේදීත් පුරවැසි සහභාගීත්වය ලබා ගැනීමට හැකි ක්‍රමවේද සකස් කළ යුතු ය. ඩිජිටල්කරණය මෙවලමක් ලෙස යොදා ගනිමින් හැකි සෑම විට ම රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය, නිරවද්‍යතාව සහ විනිවිදභාවය ඉහළ නැංවෙන පරිදි කටයුතු කරමින් එළඹෙන 2025 වර්ෂය සාධනීය පරිවර්තනයක අඩිතාලමක් කර ගත යුතු ය.

05. එමෙන් ම, අප සමාජය පොදුවේ මුහුණ දෙන අර්බුද රැසක් කෙරෙහි ද මෙම අවස්ථාවේදී රාජ්‍ය සේවයේ අවධානය යොමු විය යුතු ය. නිසි ප්‍රමිතියෙන් තොර ආහාර හා අවිධිමත් ආහාර රටාවන් හේතුවෙන් බෝ නොවන රෝග විශාල වශයෙන් පැතිරී යයි. ආහාර වෙළඳාම වැනි ක්ෂේත්‍ර තුළ පරිභෝජනයට නුසුදුසු යෙදවුම් යොදා ගැනීම මෙන් ම ප්‍රමිතියෙන් තොර ආහාර සැපයීම ද සිදු වේ. ඩෙංගු වැනි වසංගත රෝග තත්ත්වයන් ව්‍යාප්ත වීම හා මර්දනය දුෂ්කර වීම කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් හා හැසිරීම ඉවහල් වේ. යහපත් ආචාරශීලී හැසිරීම සම්බන්ධයෙන් සාඩම්බර ඉතිහාසයකට හිමිකම් කියන අප රටේ සංචාරක කර්මාන්තය, විදේශ රැකියා වැනි ක්ෂේත්‍ර තුළ ඊට පටහැනි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වේ. පොදු පහසුකම් සැපයීමේදී හා නඩත්තු කිරීමේදී අපේක්ෂිත ප්‍රමිතියෙන් තොරව පවතී. රාජ්‍ය-පෞද්ගලික අංශයේ ගොඩනැඟිලි ඉදිකිරීමේදී ද, රජය විසින් ලබා දෙන අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය වැනි සේවා සම්පාදනයේදී විශේෂ අවශ්‍යතා සහිත පුරවැසියන් නොසලකා හරින පිරිසක් බවට පත්ව ඇත.

06. සමාජයක් වශයෙන් අප සුපිළිපන්න බව එතරම් අගය නොකරන ජාතියක් බවට පත්වීම තුළ සමාජයට වගවීමේ ක්‍රියාවලියේදී සියලුම පාර්ශ්වයන් විසින් ඒ සම්බන්ධයෙන් පෙන්නුම් කරනුයේ උදාසීන ප්‍රතිචාරයකි. එය සමාජය තුළ යහපත් මානව සබඳතා ගොඩනැංවීමට බාධාවක් බවට පත්ව ඇත.

07. වර්තමානයේ රටේ සංස්ථාපිත පොදු සහ පුද්ගලික ඉදිකිරීම් නිසි ප්‍රමිතියක් නොමැතිවීම ප්‍රමුඛ දුර්වලතාවක් ලෙස හඳුනාගත හැක. රටේ පොදු දේපළ ගොඩනැගීම, ඒවා පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් නීති පද්ධතියක් පැවැතුන ද, අවිධිමත් සංවර්ධන ක්‍රියාවලි තුළින් එම නීති රීති උල්ලංඝනය කරමින් ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් සිදු කර ඇත. ප්‍රවාහන, සනීපාරක්ෂක, නිවාස හා ඉදිකිරීම් වැනි යටිතල පහසුකම් තුළ මෙන් ම අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි පද්ධතීන්වල ද මෙම ප්‍රමිතිකරණ දුර්වලතාවන් නිරීක්ෂණය කළ හැක. මෙම ක්‍රියාවල අවසන් වගකීම රාජ්‍ය අංශයට යොමු වීම ද රාජ්‍ය සේවයේ අවධානයට යොමු විය යුතු ය.

08. මෙම සියලු කරුණු ඇතුළුව රට තුළ සදාචාරාත්මක, පාරිසරික හා සමාජමය වෙනසක් ඇති කරමින්, රට ප්‍රමිතිගත කිරීමේ අරමුණ පෙරදැරිව රජය විසින් "Clean Sri Lanka" වැඩසටහන සැලසුම් කර ඇති අතර එම වැඩසටහන එළිදැක්වීම 2025.01.01 දින ජනාධිපතිවරයා විසින්, ජනාධිපති කාර්යාලයේදී සිදු කිරීමට විධිවිධාන සලසා ඇත. මෙම වැඩසටහන මෙහෙයවීමට රටේ සියලුම පාර්ශ්ව නියෝජනය කරන පිරිසකගෙන් සමන්විත ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවමින් ගැසට් පත්‍රයක් ද නිකුත් කර ඇත.

09. ඒ අනුව, එළඹෙන 2025 වසරේ රාජකාරී ඇරඹෙන පළමු දිනය වන ජනවාරි මස 01 වන බදාදා දින "Clean Sri Lanka" වැඩසටහන එළිදැක්වීම රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව සිදු කිරීමට "Clean Sri Lanka" ජනාධිපති කාර්යසාධක බලකාය, ජනාධිපති කාර්යාලය හා එක්ව වැඩසටහනක් සම්පාදනය කර ඇත. එහිදී, සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සමස්ථ රාජ්‍ය සේවයේ නියුතු පිරිසගේ සහභාගීත්වයෙන්, ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන කාර්යයට සමගාමීව

සිය සේවා ස්ථානවල රාජකාරී කටයුතු ආරම්භ කිරීමේ නිල උත්සවය පැවැත්විය යුතුයි. මහජන අභිලාෂ සම්පූර්ණ කරනු වස්, මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා සමස්ත රාජ්‍ය සේවය ම තිර අදිටනින් කැප විය යුතු බැවින් ඊට සමගාමීව එදින එම වේලාවට ම පහත දැක්වෙන වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම් නියෝජනය කරන සියලු ම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය.

I. **පෙ.ව. 8.30 ට:** අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ ආයතන ප්‍රධානීන් විසින් ජාතික ධජය එසවීම
II. ජාතික ගීය ගායනා කිරීම
III. රට වෙනුවෙන් මිය ගිය සියලුම දෙනා සැමරීම සඳහා මිනිත්තු 02 ක නිශ්ශබ්දතාවක් පැවැත්වීම
IV. **පෙ.ව. 9.00 ට:** ජනාධිපති කාර්යාලයේ සිට සියලුම ජනමාධ්‍ය ඔස්සේ විකාශනය කෙරෙන "Clean Sri Lanka" වැඩසටහන එළිදැක්වීමේ ජාතික උත්සවය සමඟ සම්බන්ධ වීම

10. ජනාධිපති කාර්යාලයේදී පැවැත්වෙන "Clean Sri Lanka" වැඩසටහන එළිදැක්වීමේ ජාතික උත්සවය සියලුම රජයේ හා පෞද්ගලික විද්‍යුත් නාලිකා මඟින් විකාශනය කිරීමට කටයුතු සලසා ඇත. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් ප්‍රධානීන් විසින් එම වැඩසටහන සජීවීව සිය කාර්ය මණ්ඩලයට නැරඹීමේ පහසුකම් සලසා දිය යුතු අතර ඇමුණුම 1 මඟින් දක්වා ඇති "Clean Sri Lanka" ප්‍රතිඥාව කියවීම සඳහා සජීවීව සම්බන්ධ විය යුතු ය.

11. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන - 011-2662340
ෆැක්ස් - 011-2692158
විද්‍යුත් තැපෑල - ade-i@pubad.gov.lk


| | | |
|---|---|---|
| පිටපත් -: 1. ගරු පළාත් ආණ්ඩුකාරවරුන් | - | කාරුණික දැන ගැනීම සඳහා |
| 2. ජනාධිපති ලේකම් | - | අවශ්‍ය කටයුතු සඳහා |
| 3. අග්‍රාමාත්‍ය ලේකම් | - | අවශ්‍ය කටයුතු සඳහා |
| 4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - | අවශ්‍ය කටයුතු සඳහා |
| 5. විගණකාධිපති | - | අවශ්‍ය කටයුතු සඳහා |

ඇමුණුම 1

# **Clean Sri Lanka** පුරවැසි ප්‍රතිඥාව/ දිවුරුම

අපි වර්ෂ 2025ට පය තබන්නේ රටේ සමස්ත පුරවැසියන්ගේ ම සිත් නැවුම් අපේක්ෂාවකින් පුරවමිනි.

රටක් ලෙස අපට මගහැරුණු, සහජීවනය, ආර්ථික හා සමාජ සංවර්ධනය, නූතනත්වය සහ සංස්කෘතික ජීවිතය යලි අත්පත් කර ගැනීම එම අපේක්ෂාවයි.

අපි අපේ රට යළි ගොඩනැංවීමේ අභියෝගයට මුහුණ දිය යුතු බව දනිමු.

"ක්ලීන් ශ්‍රී ලංකා" යනු පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් නිර්මාණය කර ගැනීමේ අත්‍යවශ්‍ය, සාමූහිකව කැපවීමේ හා වගවීමේ ක්‍රියාවලියයි. ජාති, ආගම් හෝ දේශපාලන භේදයකින් තොරව මෙම ජාතික වැඩසටහන හා එක්ව කටයුතු කිරීමට ප්‍රතිඥා/ දිවුරුම් දෙමු.

සෑම කටයුත්තකදී ම පුරවැසියන්ට උසස් සමාජ තත්ත්වයක් ලබා කර දීමට ඉවහල් වන, එකමුතුකම, වගවීම, අරපිරිමැස්ම, විනිවිදභාවය හා සමානාත්මතාව යන කරුණු පරමාදර්ශයන් ලෙස පිළිපැදීමටත් එකී ප්‍රමිතීන් ආරක්ෂාකර ගනිමින් ගැටලු සඳහා විසඳුම් සපයා ගැනීමටත් කැපවෙමු.

අභිමානවත් ශ්‍රී ලාංකික පුරවැසියන් වශයෙන් ලස්සන රටක් නිර්මාණය කර ගැනීමටත්, පොහොසත් ජීවිතයක් ළඟා කර ගැනීමටත් අවංකව හා එක්සිත්ව කැපවන බවට ගෞරව බහුමානයෙන් ප්‍රතිඥා/දිවුරුම් දෙමු.